**ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 29 දින නීතිපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,277.44 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 943.98 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 333.46 ක් හෙවත් සියයට 26.10 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | සියයට |
| පුනරාවර්තන | 671.14 | 657.42 | 13.72 | 2.04 |
| මූලධන | 606.30 | 286.56 | 319.74 | 52.74 |
| **එකතුව** | **1,277.44** | **943.98** | **333.46** | **26.10** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා අංක 20.03.02.11 දරන ආදායම් සංකේතය යටතේ රු.මිලියන 35.30 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 38.52 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 96.30 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.11 | 40.00 | 38.52 | 1.48 | 3.70 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 23.00 | 21.96 | 12.00 | 15.69 | 80.00 | 47.88 |

## 2.4 විගණන නිරීක්ෂණය

නීතිපති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

## 3.2 ආදායම් ගිණුම

දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් අංක 20.03.02.11 දරන ආදායම් සංකේතය යටතේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 40 ක් වුවද, එය රු.මිලියන 35.3 ක් ලෙස ආදායම් ගිණුමේ ඩීජීඑස්ඒ - ආදායම් - 1 ආකෘතියේ දක්වා තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව, හිඟහිටි ආදායම රු.208,772,615 ක් වුවද, විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අනුව 2005 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී ආයතන 183 කින් අයවිය යුතු හිඟ ආදායම රු.200,828,879 ක් විය. ඒ අනුව ලේඛනගත හිඟ ආදායම, ගිණුමෙන් නිරූපනය වන හිඟ ආදායමට වඩා රු.7,943,736 කින් අඩුවී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව, රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දින වන විට ආයතන 183 කින් අයවිය යුතු උපලේඛනගත හිඟ ආදායම රු.200,828,879 ක් විය. එහි කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| **ආදායම් හිඟහිටි කාල පරාසය** | **ආදායම් ලැබිය යුතු ආයතන සංඛ්‍යාව** | **හිඟ හිටි ආදායම** |
|---|---|---|
| | | රු. |
| වර්ෂ 1 ට අඩු | 79 | 23,770,699 |
| වර්ෂ 1 සිට 3 දක්වා | 119 | 79, 946,551 |
| වර්ෂ 4 සිට 6 දක්වා | 125 | 55,496,040 |
| වර්ෂ 7 සිට 9 ත් දක්වා | 32 | 27,601,999 |
| වර්ෂ 10 ට වැඩි | 33 | 14,013,590 |
| **එකතුව** | | **200,828,879** |

(ඇ) ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුමට අනුව, සමාලෝචිත වර්ෂයේදී රු.38,520,245 ක ආදායම් රැස්කර තිබුණි. එම ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේදි රු.62,827,220 ක ආදායම් බිල් කර තිබුණු අතර ඉන් රු.27,322,315 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ බිල් කළ ආදායමෙන් රු.35,504,905 ක් හිඟහිට පැවැතුණි. දෙපාර්තමේන්තුවේ ආදායම් බිල් කිරීම සිදු කරනු ලබන සංස්ථා ගිණුම් අංශයෙන් ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම රු.23,770,699 ක් ලෙස හෙළිදරව් කර තිබුණු බැවින් ආදායම් ගිණුමේ වාර්තා කර තිබුණු හිඟහිටි ආදායම රු.11,734,206 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ආදායම් සංකේතයට අදාළ ආදායම් තක්සේරු කිරීම, එකතු කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම සම්බන්ධව නිලධාරීන් අතර බලතල පවරා දීමක් සිදු කර නොතිබුණි.

(ඊ) නීති සේවාවක් අවසන් වූ පසු නෛතික ගාස්තු බිල් කිරීම දෙපාර්තමේන්තුවේ සංස්ථා ගිණුම් අංශයෙන් සිදු කර තිබුණු අතර ඒ සඳහා කලින් අංකනය කරන ලද ඉන්වොයිස් භාවිතා කර නොතිබුණි.

(උ) නිකුත් කරන ඉන්වොයිස්පත් දෙපාර්තමේන්තුවේ වගකිව යුතු නිලධාරියකු විසින් අත්සන් කර නොතිබුණු අතර සංස්ථා ගිණුම් අංශයේ කළමනාකරණ සහකාර තනතුර දරන නිලධාරියෙකු අත්සන් කර තිබුණි.

(ඌ) නෛතික ගාස්තු ලැබීම්, බැංකුගත කිරීම, දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයෙන් සිදුකරන අතර ඉන්වොයිසියේ පිටපතක් ගිණුම් අංශයට නොලැබීම හේතුවෙන් ඉන්වොයිස් කරනු ලබන සියළු මුදල් ලැබුණාදැයි ගිණුම් අංශයට තහවුරු කර ගත නොහැකි වී තිබුණි.

(එ) චෙක්පත නීතිපතිවරයා නමින් නිකුත් කරන ලෙස ඉන්වොයිසියෙහි සඳහන් කර තිබුණද, චෙක්පත ලිවිය යුතු බැංකු ගිණුමේ නම හා ගිණුම් අංකය සඳහන් කර නොතිබුණි.

(ඒ) තැපැලෙන් හෝ අතින් රැගෙන එන චෙක්පත්, මුදල්, මුදල් ඇණවුම් කවුන්ටරයට භාර දෙනු ලැබීමෙන් හැර වෙනත් ආකාරයකට ලැබෙන විට මාණ්ඩලික නිලධාරියෙකු විසින් ඒවායේ ගණන් ප්‍රමාණය චෙක්පත්, මුදල් ඇණවුම් ලේඛනයෙහි (ජී ඒ ඇම් 83 ආකෘති පත්‍රයේ) වහාම සටහන් කර සහතික කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ඔ) රාජ්‍ය ආදායමේ කොටසක් වශයෙන් හෝ තමාට ලැබෙන මුළු මුදලම දිනපතා හෝ හැකිතාක් කලින් ප්‍රේෂණය කළ යුතු වුවත්, සංස්ථා ගිණුම් අංශයට ලැබෙන චෙක්පත් දින 06 ක සිට දින 19 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයක් සහිතව බැංකු ගත කර තිබුණු බව නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය.

(ඕ) මුදල් රෙගුලාසි 185 ප්‍රකාරව, මුදල් භාර ගන්නා නිලධාරියෙකුට ලැබෙන සියලු මුදල්, මුදල් පොතේ හා වෙනත් පොත්වල නිසි පරිදි සටහන් කර මුදල් පොතේ ලැබීම් පැත්තේ ඇති සටහන් වෙනත් ගිණුම්වල බැර සටහන් සමඟ වරින් වර සංසන්දනය කර බැලිය යුතුය. නමුත් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන චෙක්පත් ප්‍රධාන මුදල් පොතේ හා ණයගැති ගිණුමට සටහන් කිරීම පිළිවෙලින් ගිණුම් අංශයෙන් හා සංස්ථා අංශයෙන් සිදුකර තිබුණු බැවින් ප්‍රධාන මුදල් පොතේ ලැබීම් සටහන් සමඟ ණයගැති ගිණුම සැසඳීමක් කර නොතිබුණි.

(ක) මුදල් පොතේ යම් මුදලක් ලැබුණු බව සටහන් වී තිබුණු දිනය මුදල් ලැබුණු දිනය විය යුතු නමුත්, මුදල් පොතේ චෙක්පත ලද බව සඳහන් දිනය වෙනුවට සංස්ථා අංශයට චෙක්පත ලද දිනය ණයගැතියන්ගෙන් මුදල් ලද දිනය ලෙස සංස්ථා අංශය විසින් ගිණුම් ගත කර තිබුණි. ඒ

හේතුවෙන් යම් කිසි මාසයක ණයගැති ලැබීම් ලෙස සඳහන් වන සියළු මුදල් එම මාසයේම මුදල් පොතේ සටහන් වී නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

-----------------------------------------

විෂය අංක 22901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.753,690 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-------------------------------------

### 3.4.1 අභ්‍යන්තර විගණනය

-----------------------

දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේදී ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,277.4 ක් හා අනුමත කාර්ය මණ්ඩලය 922 ක් වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම්වල වටිනාකම රුපියල් මිලියන 738.2 ක් වී තිබුණි. මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව 2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. 2017 අගෝස්තු 14 දින ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරියකු දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබුණු නමුත්, අභ්‍යන්තර විගණන ඒකකයේ කටයුතු පවත්වා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර නොතිබුණි.

### 3.5 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

----------------------------------------------------

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

-------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2016 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | | | රු.මිලියන | |
| දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ල ඉදිකිරිම | 1,182 | 2015.12.08 | 2017.12.31 | 258 | ප්‍රසම්පාදන කමිටු වෙනස් කිරීම නිසා ඇතිවී තිබුණු ප්‍රමාදයන් නිසා කොන්ත්‍රාත්තුව ප්‍රමාද කර ප්‍රදානය කිරිම. පළමු අදියර වූ පාදම කොන්ක්‍රිට් කිරීමේ කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාදවීම හා ගොඩනැගිල්ල ඉදි කිරීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාදවීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| වව්නියාව, මන්නාරම, කුරුණෑගල, මහනුවර අධිනීතිඥ නිල නිවාස ඉදිකිරීම | 106 | 2015.06.15 | 2017.12.31 | 28 | ඉකුත් වර්ෂයේ රු.223,417 ක් වැය කර ඉදිකිරීම් ආරම්භ කර තිබුණු මහනුවර නිල නිවාසය ඉදිකිරීම නවතා තිබීම. කුරුණෑගල නිල නිවාසය ඉදිකිරීම ආරම්භ කර නොතිබීම, ඉදිකිරීම් කටයුතු යුධ හමුදාව මඟින් කිරීමේදී වියදම නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම. |

## 3.6 කාර්යසාධනය

2016 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව, දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| අංශය | 2016 වර්ෂයේදී විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | 2016 දෙසැම්බර් 31ට වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව |
|---|---|---|---|
| සිවිල් අංශය | 2933 | 301 | 333 |
| අපරාධ අංශය | 4814 | 4274 | 13110 |
| සංස්ථා අංශය | 2202 | 1750 | 5986 |
| මහජන පෙත්සම් ඒකකය | 690 | 258 | ඉදිරිපත් කර නොතිබුණි. |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | 3651 | 2354 | ඉදිරිපත් කර නොතිබුණි. |
| රාජ්‍ය නීතිඥ අංශය | 219 | 2473 | ඉදිරිපත් කර නොතිබුණි. |
| ශේෂ්‍යාධිකරණ ඒකකය | 493 | 138 | 355 |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 271 | 200 | 71 | - |
| (ii) | තෘතියික මට්ටම | 13 | 10 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 191 | 122 | 69 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 255 | 223 | 32 | - |
| (v) | වෙනත් - | | | | |
| | • කොන්ත්‍රාත් පදනම මත | 192 | 29 | 163 | - |
| | • බඳවාගත් පදනම හඳුනාගත නොහැකි | - | 72 | - | 72 |
| | **එකතුව** | **922** | **656** | **338** | **72** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සංස්ථා අංශය, මහජන පෙත්සම් අංශය හා ලඝු නොවන නඩු අංශයෙහි සේවය කරන බඳවා ගැනීමේ පදනම හඳුනාගත නොහැකි සේවක සංඛ්‍යාව 72 ක් පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.